**ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) පූනාකරි

(ආ) කරච්චි

(ඇ) පච්චිලයි පල්ලි

(ඈ) කන්දවලෙයි

**1.1 විගණන විෂය පථය**

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මූළ ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 187 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 182.81 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 4.19 ක් හෙවත් සියයට 2.24 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 145.45 | 141.38 | 4.07 | 2.80 |
| මූලධන | 41.55 | 41.43 | 0.12 | 0.28 |
| එකතුව | 187.00 | 182.81 | 4.19 | 2.24 |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 17 කින් හා දෙපාර්තමේන්තු 13 කින් සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 262.36 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු එම ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 247.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනවලින් රු.මිලියන 2.11 ක් හෙවත් සියයට 0.8 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26801 | 12.00 | 10.35 | 06.00 | 10.03 | 49.00 | 41.22 |

**2.2.2 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංක 7002/0000/00/0286/0014 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.333,811 ක් විය.

**2.3 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට ගිණුම් අංක 6003/0000/00/0044/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.32,851,256 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3 ශීර්ෂය 268 - කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ කච්චේරිය

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු ආදායම් ගිණුම් 2015 නොවැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි. |
| ස්ථාවර වතක්ම් ලේඛණය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| ණය ලේඛණය (CC10) | මුදල් රෙගුලාසි 506 | යාවත්කාලින කර නොතිබුණි. |
| දුරකථන ලේඛණය | මුදල් රෙගුලාසි 845(1) හා 845(3) | යාවත්කාලීන කර නොතිබුණි |

## 3.3 විසර්ජන ගිණුම්

----------------

### 3.3.1 අයවැය විචලනය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාගේ කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වියදම් ඇස්තමේන්තු තත්කාර්ය පදනම ආකාරයෙන් පිළියෙල කර තිබූ අතර වැය විෂයයන් 10ක් සඳහා අර්ධ වශයෙන් උපයෝජනය කර තිබුණි. වැය විෂයයන් 10ක මුල් ප්‍රතිපාදනයන් රු.1,807,000කින් අඩුකර තිබුණු අතර තවත් වැය විෂයයන් 05ක ප්‍රතිපාදන එම වටිනාකමින් වැඩිකර තිබුණි.

(ආ) වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීම් සහ ඉතිරිවීම් සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) රු.725,553ක් වු මූලධන වියදම්, අවස්ථා 07ක දි වැරදි ලෙස විවිධ පුනරාවර්තන වැය විෂයයන් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඈ) එක් මූලධන වැය විෂයයක වටිනාකම වු රු. 1,933,750 ක මුදල අවස්ථා 07 කදි මූලධන ස්වරූපයේ වැය විෂයයන් කිහිපයක් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඉ) රු. 327,270 ක් වු පුනරාවර්තන වියදම් අවස්ථා 07කදි විවිධ මූලධන වැය විෂයයන් කිහිපයක් යටතේ වැරදි ලෙස ගිණුම් ගත කර තිබුණි.

### 3.3.2 වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

--------------------------------------------------------------------------------

වැය ශීර්ෂ 285 ට අදාල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් රු. 75,000ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම

--------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියෙකුට තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවිය හැක්කේ රු.20,000ක් පමණි.මෙයට පටහැනිව නිලධාරියෙකුට තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් රු.915,000ක මුදලක් සීමාව ඉක්මවා අවස්ථා දෙකකදි ගෙවා තිබුණි.

### 3.5 පොදු තැන්පත් ගිණුම

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන 03කට අදාලව එකතුව රු.7,000,000ක් වූ වී මිලදී ගැනීමේ අත්තිකාරම් වර්ෂ එකේ සිට දෙකකට වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි.

(ආ) තාවකාලික මාර්ග බලපත්‍ර නිකුත් කිරීම තුළින් රැස්කර ගන්නා ලද රු.5,576,468 ක් වූ මුදල් අදාල අධිකාරියට ප්‍රේෂණය කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

(ඇ) පූනාකරි නගරයේ රෝහලක් සඳහා ඉඩමක් මිලදී ගැනීමට පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව විසින් ලබාදුන් රු.3,750,000ක් වූ මුදල් දිස්ත්‍රික් ලේකම කාර්යාලය විසින් 2013 මැයි 28 දින ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කර තිබුණි. 2015 නොවැම්බර් 30 දින වන විටත් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම මුදල් උපයෝජනය කර නොතිබුණි.

(ඈ) ජීවනෝපාය අත්තිකාරම් ලෙස ගොවියන් තිදෙනෙකු වෙත රෝද දෙකේ ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා 2010 වර්ෂයේදී රු.310,900 ක මුදලක් පොදු තැන්පත් ගිණුමෙන් ලබාදී තිබූ නමුත් 2015 නොවැම්බර් 30 දින වන විටත් මෙම මුදල් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ 02ක් ඉක්ම වූ රු. 688,171ක තැන්පතු ශේෂ 65ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

--------------------------------------------

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දින වන විට සේවය තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.807,595ක් වූ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදි නිලධාරියෙකු වෙත ගෙවන ලද ආපදා ණය මුදල් රු.31,600 ක් පඩිනඩි ලේඛණයේ (වැටුප් පද්ධතිය) ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් පූනාකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදි එම නිලධාරියාට රු. 31,600 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

3.7 **අනුකූල නොවීම්**

**-------------------**

**නීතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

--------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතී, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | -------------------------------- | --------------------- |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** <br> ------------------------------ <br> මුදල් රෙගුලාසි 756 | ග්‍රාම නිලධාරි කාර්යාල 95කට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2014 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂයේදි සිදුකර නොතිබුණි. |
| (ආ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ** <br> ---------------------- <br> 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන චක්‍රලේඛය | මුදල් සහ ගබඩා කටයුතුවල නියැලෙන නිලධාරීන් හයදෙනෙකුගෙන් ආරක්ෂක ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන 17ක ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර ලොග් සටහන්ද තබා නොතිබුණි. |

## 3.8 අධිකාරි බලය නොමැති ගනුදෙනු

---

දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල නිවසට (CCTV Camera) ආරක්ෂක කැමරා සපයා සවිකිරීම සඳහා රු.226,650ක මුදලක් ගෙවා තිබූ අතර මේ සඳහා රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3.9 මූල්‍ය වංචා ස්වරූපයේ ගනුදෙනු

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**රු. 1,205,515ක එකතු කළ අගය මත බදු (VAT)ගෙවීම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකවල වලංගුභාවය පරීක්ෂා කිරීමකින් තොරව සිවිල් වැඩ සඳහා එකතු කළ අගය මත බදු (VAT) මුදල් රු.1,205,515ක් ගෙවීම් කර තිබූ අතර මෙලෙස මුදල් ගෙවන අවස්ථාවේදී එක් කොන්ත්‍රාත්කරුවෙකුගේ එකතු කළ අගය මත බදු අංක අවලංගු කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ ගෙවීම් වංචා සහගත ඒවා බව සැළකිය හැක.

## 3.10 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) කන්දවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම් ප්‍රදානය කිරීමේ අවස්ථාවේදි කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් මුදලින් සියයට 13ක වට්ටමක් ලබාදෙන බවට එකඟ වී ඇත. කෙසේ වුවද, එකඟ වූ වට්ටම් මුදල් පිළිබඳව සැලකිලිමත් නොවී කළවැඩ සඳහා අවසාන ගෙවීම් වශයෙන් රු. 843,522ක මුදලක් ගෙවා තිබුණි.මේ අනුව රු.109,658ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) කිලිනොච්චියේ පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ අදියර III හි කොන්ත්‍රාත්තු ගිවිසුමේ ඡේදය (උ) ප්‍රකාරව නිම කිරීමට නියමිතව තිබුණේ 2014 නොවැම්බරු 06 දිනදීය. එසේ වුවද, සත්‍ය වශයෙන් ම වැඩ නිම කර තිබුණේ දින 34ක ප්‍රමාදයකින් පසු(ඉරිදා දිනයන් හැර) 2014 දෙසැම්බර් 15 දිනයේදී බව විගණනයේදි නිරීක්ෂණය වු නමුත් රු.1,852ක් පමණක් ප්‍රමාද ගාස්තු වශයෙන් අයකර තිබුණි. මේ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ (ඌ) ඡේදය ප්‍රකාරව රු.158,707ක මුදලක් කොන්ත්‍රාත්කරුගෙන් අඩුවෙන් අය කරගෙන තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 16 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 105 | 84 | 21 |
| (iii) | ද්විතියික මට්ටම | 211 | 146 | 65 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 91 | 55 | 36 |
| | | 426 | 301 | 125 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් ලේකම් කාර්යාලය විසින් පුරප්පාඩු 125ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.